**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හිජාස් ඔමර් හිස්බුල්ලා සහ සලීම්කාන් මොහොමඩ් ශාකීල් (පාස්කු ප්‍රහාරය හා එහි සිදුවීම්වලට සබැදිව ගොනු කරන ලද නඩුවකි.)

**Case no (නඩු අංකය):** HC 78/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2024/05/17

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** ජනින්දි චාමිකා, ලක්ෂාන් වික්‍රමසිංහ

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | නදී අපර්ණා සුවන්දුරුගොඩ විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණී ගිරිහාගම මැතිණිය ඇතුළු තවත් නීතිඥවරු කිහිපදෙනෙකුන් | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects/Respondent (චූදිත/ සැකකරුවන්/ වගඋත්තරකරු)** | 01. හිජාස් ඔමර් හිස්බුල්ලා<br>02. සලීම්කාන් මොහොමඩ් ශාකීල් | |
| **Lawyers for accused /suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | ජනාධිපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස මහතා<br>නීතිඥ චමින්ද අතුකෝරාල මහතා | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | | |
| **Others (වෙනත් අය)** | ලීසා වැන්ස්ටෝල් (Lisa Whanstall) | |

**2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?**

පසුගිය නඩු වාරයේදී නඩු භාණ්ඩ ඉදිරිපත් කිරීමට අධිකරණයෙන් නියෝගයක් ලබාගෙන තිබෙන නමුත් මේ දක්වා එම නඩු භාණ්ඩ ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය භාරයේ පවතින එම නඩු භාණ්ඩ ගෙන්වා ගැනීමට ඉල්ලීම කර ඇත්තේ 2024/05/09 වන දින වන අතර එම ඉල්ලීම ඔවුන් වෙත ලැබී ඇති බව 2024/05/15 වන දින රෙජිස්ට්‍රාර්වරිය විසින් පුත්තලම මහාධිකරණයට දැනුම් දී ඇතත් රෙජිස්ට්‍රාර්වරියගේ අසනීප තත්ත්වය හේතුවෙන් නඩු භාණ්ඩ ලබා දීමට නොහැකි බවද දන්වා තිබුණි. විත්තිය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන් විසින් නඩු භාණ්ඩවලට අදාල ඡායා පිටපත් මත පදනම් වී නඩු කටයුත්ත මෙහෙයවීමට නොහැකිදැයි විමසූ විට පැමිණිලි පාර්ශවය විසින් අදාල නඩු භාණ්ඩවල ඡායා පිටපත් තමන් ලබාගැනීමට උත්සහ කලද එය සාර්ථක නොවූ බව ප්‍රකාශ කරන ලදී. නැවතත් විත්තිය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන් අධිකරණයෙන් ඉල්ලා සිටියේ, අදාල නඩු භාණ්ඩ මෙම නඩු කටයුත්ත සඳහා කොතෙක් දුරට අදාල වනවාද? යන්න සලකා බලන ලෙසයි. එම අවස්ථාවේ පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි රජයේ අධිනීතිඥවරු තමන්ද එම නඩු භාන්ඩ දැක නැතිබව ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත් අධිකරණය විසින් නඩු භාණ්ඩ ලබාගත් පසු පැමිණිලි පාර්ශවයට, රෙජිස්ට්‍රාර්වරිය සමග ඒවා පරීක්ෂා කොට ඡායා පිටපත් ලබා ගැනීමට අවසර ලබාදෙන ලදි. එමෙන්ම විත්තිය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන් විසින් ඊළග නඩු වාරය සඳහා හැකි ඉක්මන් දිනයක් අධිකරණයෙන් ඉල්ලා සිටි අතර ඊට ප්‍රතිචාර දැක්වූ අධිකරණය විසින් 2024 ජූලි මස 26 වන දින සහ 2024 අගෝස්තු මස 09 වන දිනයන්හීදි මීළග නඩු විභාගයන් පැවැත්වෙන බවට පාර්ශවයන් වෙත දැනුම් දෙන ලදි.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –** නැත.

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2024 ජූලි 26 සහ 2024 අගෝස්තු 09

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා කළේද?): -** ඔව්.
<https://x.com/hejaazh/status/1791526320347767190?t=5rUkQhzSHGnTNh3bBjZzeA&s=09>